සිංහල දර්ශනපති/දර්ශනසූරි පාඨමාලා

# Mphil/Phd Programs in Sinhala

(**2025-2026**)

**උපදේශ සංග්‍රහය**


සිංහල අධ්‍යයනාංශය

ශාස්ත්‍රපීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# හැඳින්වීම

සිංහල භාෂාව, සාහිත්‍යය, සංස්කෘතිය, සමාජය සහ කලා ශිල්ප යනාදී අධ්‍යයන ක්ෂේත්‍රවල ස්වාධීන, ගැඹුරු, ශාස්ත්‍රීය සහ විද්‍යාත්මක පර්යේෂණහි නිරත වීම සඳහා විද්‍යාර්ථීන්ට අවශ්‍ය දැනුම, හැකියා සහ මාර්ගෝපදේශ ලබා දෙන උසස් උපාධි පාඨමාලා වශයෙන් සිංහල දර්ශනපති සහ දර්ශනසූරි පාඨමාලා හැඳින්විය හැකි ය. විවිධ ශාස්ත්‍රීය සහ බුද්ධිමය පසුබිම්වලින් පැමිණෙන විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ කුසලතා මෙන් ම විෂය දැනුම ද වර්ධනය කිරීම උදෙසා සැලසුම් කර ඇති මෙම පාඨමාලාවල ප්‍රමුඛ අභිලාෂය වන්නේ තත් විෂය සම්බන්ධ ස්වාධීන පර්යේෂකයන් සහ ශාස්ත්‍රඥයන් බිහි කිරීමයි.

එහි දී විද්‍යාර්ථීන් ස්වාධීන පර්යේෂණය ආරම්භ කිරීමට පූර්වයෙන් විෂය ක්ෂේත්‍ර සම්බන්ධ අනිවාර්ය සම්මන්ත්‍රණ පාඨමාලා ඔස්සේ සිංහල පර්යේෂණ ක්ෂේත්‍ර පිළිබඳ පෘථුල අවබෝධයක් ලබා දීමත්, උසස් පර්යේෂණ ක්‍රමවේදය පාඨමාලාව මඟින් ස්වාධීන පර්යේෂණයට අවශ්‍ය විද්‍යාත්මක පුහුණුව ලබාදීමත් සිදු කෙරේ. මෙම අනිවාර්ය පාඨමාලාවලට සහභාගී වීම, මාස හයකට වරක් පර්යේෂණයේ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම, පර්යේෂණ යෝජනාවලියට අදාළ වාචික පරීක්ෂණයට මුහුණ දීම, සුපරීක්ෂකවරයෙකුගේ/සුපරීක්ෂකවරුන්ගේ උපදේශනය යටතේ පර්යේෂණයේ නිරතවීම, පර්යේෂණ නිබන්ධයක් රචනා කර බාරදීම සහ අවසානයේ වාචික පරීක්ෂණයකින් සමත්වීම යන කඩයිම් නිසියාකාර ව පසුකර දර්ශනපති/දර්ශනසූරි උපාධි හිමිකර ගැනීමට විද්‍යාර්ථීන්ට අවස්ථාව සැලසේ.

## දර්ශනපති පාඨමාලාව Mphil Program

බඳවා ගැනීමේ සුදුසුකම්

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් සහිත යෝජිත පර්යේෂණය ක්ෂේත්‍රයට අදාළ විෂයයකින් පර්යේෂණයක් පමණක් හෝ පර්යේෂණයක් සහ විෂය පාඨමාලා සහිත දෑ අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව (මෙය ශ්‍රී ලංකා ගුණාත්මක භාවය පිළිබඳ රාමුවේ (SLQF) 10 වන පියවරට අදාළ සුදුසුකමක් විය යුතු ය)

හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් යෝජිත පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ විෂයයකට අයත් එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවක්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණය සහ/හෝ අත්දැකීම් (ශ්‍රී ලංකා ගුණාත්මක භාවය පිළිබඳ රාමුවේ (SLQF) 09 වන පියවරට අදාළ ප්‍රවේශ සුදුසුකමක් වීම සහ අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණය සහ/ හෝ අද්දැකීම් සපුරා තිබීම).

හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් ප්‍රථම පන්ති සාමර්ථ්‍යය සහිත ශාස්ත්‍රවේදී සිංහල ගෞරව උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණය සහ/ හෝ අත්දැකීම් (ශ්‍රී ලංකා ගුණාත්මක භාවය පිළිබඳ රාමුවේ (SLQF) 06 වන පියවරට අදාළ සුදුසුකමක් විය යුතු ය).

**පාඨමාලා කාලය**

දර්ශනපති පාඨමාලාව සඳහා නියමිත කාලය අධ්‍යයන වර්ෂ දෙකකි. නිබන්ධය බාරදීමට මාස තුනකට පෙර ඒ බව අදාළ අයදුම්කරුවන් සිංහල අධ්‍යයනාංශය වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය. දෙවන අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකය අවසානයේ දී අයදුම්කරුවන් තම පර්යේෂණ නිබන්ධය බාර දිය යුතු ය. කෙසේ වෙතත් මේ කාල සීමාවේ දී සාධාරණ හේතු මත තම නිබන්ධය අවසන් කර බාර දීමට නොහැකි වන අයදුම්කරුවන් සඳහා තම නිබන්ධය සම්පූර්ණ කිරීමට මාස 6ක් සඳහා කාලය දීර්ඝ කර ගැනීමට අයැදුම් කිරීමේ හැකියාව පවතී. එහි දී අදාළ අමතර කාලය සඳහා අනුමත අමතර ගාස්තු ගෙවීමට ඔවුන් බැඳී සිටින අතර පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා හිමි වන උපරිම කාල සීමාව ලියාපදිංචි දින සිට වසර පහකි.

**නිබන්ධය: දර්ශනපති**

දර්ශනපති පාඨමාලාව සඳහා ඉදිරිපත් කළ යුතු නිබන්ධය අධ්‍යයනාංශය විසින් නිර්දේශිත උපදෙස්වලට අනුකූල ව රචනා විය යුතු අතර එහි වචන සංඛ්‍යාව, අදාළ වගු, ප්‍රස්තාර සහ රූප සටහන් ද ඇතුළත් ව ආශ්‍රිත මූලාශ්‍රයාවලිය නොමැති ව වචන 50,000-65,000ත් අතර විය යුතුය.

පහත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් වෙත දර්ශනපති උපාධිය ප්‍රදානය කෙරේ.

(i) කොළඹ විශ්වවිද්‍යාලයේ,ශාස්ත්‍රපීඨයේ පශ්චාත් උපාධි අයදුම්කරුවකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතුය.

(ii) ඉන් අනතුරු ව අවම වශයෙන් අවුරුදු දෙකක කාලයක් අනුමැතිය ලද පර්යේෂණ කටයුතුවල නිරත වී සිටිය යුතුය.

(iv) අනුමත ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවා තිබීම; සහ පහත සඳහන් කොන්දේසි සපුරා ඇති අපෙක්ෂකයකු වීම:

(a) සුපරීක්ෂකවරයාගේ/සුපරීක්ෂකවරුන්ගේ අනුමැතියට යටත් ව විශ්වවිද්‍යාලය සනාතන සභාව විසින් පිළිගැනුණු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම

(b) පරීක්ෂක මණ්ඩලයක් මඟින් නිබන්ධය අදාළ උසස් උපාධිය සඳහා සුදුසු යැයි ලෙස නිර්දේශ කර තිබීම

(c) අවසන් වාචික පරීක්ෂණයෙන් (Viva-voce) සමත්වීම.

## දර්ශනසූරී පාඨමාලාව PhD Program

බඳවාගැනීමේ සුදුසුකම් :

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් යෝජිත මාතෘකාවට අදාළ විෂයයකින් ලබා ගත් දෑ අවුරුදු දර්ශනපති (Mphil) උපාධිය ( ශ්‍රී ලංකා ගුණාත්මක භාවය පිළිබඳ රාමුවේ (SLQF) 10 වන පියවරට අදාළ ප්‍රවේශ සුදුසුකමක් වීම සහ අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණය සහ/ හෝ අත්දැකීම් සපුරා තිබීම)

හෝ

II. කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨයේ සිංහල දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී අනුමත පර්යේෂණ කාර්යයේ අවම වශයෙන් වසරක කාලයක් නිරත ව සිට ශාස්ත්‍ර පීඨයේ උසස් උපාධි කමිටුව (HDC) මඟින් පත් කෙරුණු විශේෂඥ මණ්ඩලයක් වෙත අදාළ නිබන්ධයේ පරිච්ඡේද ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව එකී මණ්ඩලය විසින් දර්ශනපති උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා උත්ශ්‍රේණි කිරීමට (upgrade) සුදුසු යැයි යෝජනා කෙරුණු අපේක්ෂකයෙකු වීම.

**දර්ශනපති උපාධිය දර්ශනසූරි උපාධිය සඳහා උත්ශ්‍රේණි (Upgrade) කිරීම**

1. දර්ශනපති උපාධි අධ්‍යයන කටයුතුවල අවම වශයෙන් වසරක කාලයක් නිරත ව සිටි උපාධි අපේක්ෂකයන් තම පර්යේෂණවල විශිෂ්ට ශක්‍යතා පෙන්වන අවස්ථාවල ඔවුන් දර්ශනසූරි උපාධි පාඨමාලාව සඳහා උත්ශ්‍රේණි කිරීමට ලැබෙන ඉල්ලීම් ශාස්ත්‍රපීඨය සලකා බලයි.
2. දර්ශනසූරි උපාධිය සඳහා අයදුම්කරුවකු උත්ශ්‍රේණි කිරීම සඳහා අදාළ සුපරීක්ෂකවරයා/වරු පාඨමාලාවේ දර්ශනසූරි පාඨමාලා සම්බන්ධීකාරකවරයා වෙත පළමු ව ලිඛිත ඉල්ලීමක් සිදු කළ යුතු ය.
3. එවන් අවස්ථාවක අදාළ අයදුම්කරු විසින් පහත සඳහන් ලිපි ලේඛන බාර දිය යුතු ය.
   i. සුපරීක්ෂකවරයා/වරුන් අනුමත කළ ස්වාධීන පර්යේෂණයේ ප්‍රගති වාර්තාව;
   ii. අවම වශයෙන් පර්යේෂණ නිබන්ධයේ පරිච්ඡේද කෙටුම්පත් තුනක් සහ
   iii. අධ්‍යයන කාලසීමාවේ දී අයදුම්කරු විසින් පළ කෙරුණු ශාස්ත්‍රීය ලිපි / සම්මන්ත්‍රණ පත්‍රිකා සහ වෙනත් ශාස්ත්‍රීය ලේඛනවල පිටපත්.

4. ඉන් අනතුරු ව සුපරීක්ෂකවරයා/වරුන්ගේ අනුමැතිය සහිතව පාඨමාලා සම්බන්ධීකාරකවරයා අදාළ උසස් කිරීමට අදාළ ලිපි ලේඛන ඇගයීම සඳහා පරීක්ෂකවරුන් දෙදෙනෙකු පත්කරන මෙන් ශාස්ත්‍ර පීඨයේ උසස් උපාධි කමිටුවෙන් ඉල්ලීමක් කරයි.

5. ඇගැයීම් වාර්තා ලැබීමෙන් පසුව විශේෂඥ කමිටුවක් ඉදිරියේ අයදුම්කරු උත්ශ්‍රේණිය සඳහා වන වාචික ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. අංශ ප්‍රධානවරයාගේ අනුමැතිය අනුව ශාස්ත්‍ර පීඨ උසස් උපාධි කමිටුව (HDC) විසින් මෙම විශේෂඥ කමිටුව පත්කෙරේ. මෙම කමිටුව අදාළ අයදුම්කරු දර්ශනසූරි උපාධිය සඳහා උත්ශ්‍රේණි කෙරෙන්නේ ද නැත්නම් තව දුරටත් දර්ශනපති උපාධි අධ්‍යයන කටයුතුවල ම නිරතවිය යුතු ද යන්න තීරණය කරයි.

**පාඨමාලා කාලය: දර්ශනසූරි පාඨමාලාව**

දර්ශනසූරි පාඨමාලාව සඳහා නියමිත කාලය අධ්‍යයන වර්ෂ තුනකි. තුන්වන අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකය අවසාන දින සිට මසක් ඇතුළත අයදුම්කරුවන් තම පර්යේෂණ නිබන්ධය බාර දිය යුතු ය. කෙසේ වෙතත් මේ කාල සීමාවේ දී සාධාරණ හේතු මත තම නිබන්ධය අවසන් කර බාර දීමට නොහැකි වන අයදුම්කරුවන් සඳහා තම නිබන්ධය සම්පූර්ණ කිරීමට අමතර මාස 6ක් සඳහා කාලය දීර්ඝ කර ගැනීමට අයැදුම් කිරීමේ හැකියාව පවතී. එහි දී අදාළ අමතර කාලය සඳහා අනුමත අමතර ගාස්තු ගෙවීමට ඔවුන් බැඳී සිටින අතර පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා හිමි වන උපරිම කාල සීමාව ලියාපදිංචි දින සිට වසර හතකි.

**නිබන්ධය: දර්ශනසූරි**

දර්ශනසූරි පාඨමාලාව සඳහා ඉදිරිපත් කළ යුතු නිබන්ධය අධ්‍යයනාංශය විසින් නිර්දේශිත උපදෙස්වලට අනුකූල ව රචනා විය යුතු අතර එහි වචන සංඛ්‍යාව, අදාළ වගු, ප්‍රස්තාර සහ රූප සටහන් ද ඇතුළත් ව ආශ්‍රිත මූලාශ්‍රයාවලිය නොමැති ව වචන 70,000-100,000ත් අතර විය යුතුය.

පහත සඳහන් කොන්දේසි සපුරා ඇති අයදුම්කරුවෝ දර්ශනසූරි උපාධිය ලැබීමට සුදුස්සෝ වෙති.

(i) කොළඹ විශ්වවිද්‍යාලයේ,ශාස්ත්‍රපීඨයේ පශ්චාත් උපාධි අයදුම්කරුවකු ලෙස ලියාපදිංචි වී සිටීම.

(ii) ඉන් අනතුරුව අවම වශයෙන් අවුරුදු තුනක කාලයක් අනුමැතිය ලද පර්යේෂණ කටයුතුවල නිරත වී සිටීම.

(iii) අනුමත ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවා තිබීම; සහ පහත සඳහන් කොන්දේසි සපුරා ඇති අපෙක්ෂකයකු වීම:

(a) සුපරීක්ෂකවරයාගේ/සුපරික්ෂකවරුන්ගේ අනුමැතියට යටත් ව විශ්වවිද්‍යාලය සනාතන සභාව විසින් පිළිගැනුණු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම

(b) පරීක්ෂක මණ්ඩලයක් මඟින් නිබන්ධය අදාළ උසස් උපාධිය සඳහා සුදුසු යැයි ලෙස නිර්දේශ කර තිබීම

(c) අවසන් වාචික පරීක්ෂණයෙන් (Viva-voce) සමත්වීම.

**අධ්‍යයන පාඨමාලා සංයුතිය**

දර්ශනපති/ දර්ශනසූරි පාඨමාලා ප්‍රධාන අංග හතරකින් සමන්විතය.

1. අනිවාර්ය සම්මන්ත්‍රණ පාඨමාලා:

    I. උසස් පර්යේෂණ ක්‍රමවේදය
    II. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය අධ්‍යයනය
    III. නූතන සිංහල සාහිත්‍යය
    IV. සාම්ප්‍රදායික භාෂා අධ්‍යයනය
    V. නූතන වාග්විද්‍යා අධ්‍යයනය
    VI. සිංහල සමාජය, සංස්කෘතිය සහ කලා ශිල්ප

ප්‍රථම අධ්‍යයන වර්ෂයේ ප්‍රථම සමාසිකයේ මෙම පාඨමාලා සම්මන්ත්‍රණ පාඨමාලා ස්වරූපයෙන් විශ්වවිද්‍යාලයේ දී පැවැත්වෙන අතර ඊට දර්ශනපති/ දර්ශනසූරි යන පාඨමාලා දෙකට ම ලියාපදිංචි වන අයදුම්කරුවන් අනිවාර්යයෙන් සහභාගී විය යුතු ය.

2. පර්යේෂණ යෝජනාවලිය: ප්‍රථම සමාසිකය අවසානයේ දී තම පර්යේෂණ යෝජනාවලිය ඉදිරිපත් කළ යුතු අතර ඊට අදාළ වාචික පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
3. පර්යේෂණය: වාචික පරීක්ෂණයක දී පර්යේෂණ යෝජනාවලිය අනුමත වීමෙන් අනතුරුව සුපරීක්ෂකවරයකු/සුපරීක්ෂකවරුන් යටතේ කෙරෙන ස්වාධීන පර්යේෂණ කටයුතු සිදු කළ යුතුය.
4. වාචික පරීක්ෂණය: නිබන්ධය බාර දීමෙන් පසු වාචික පරීක්ෂණයට (Viva-voce) මුහුණ දිය යුතු ය.
5. නිබන්ධය: සුළු සංශෝධන/නිවැරැදි කිරීම් සහිත ව වාචික පරීක්ෂණය සමත් වූයේ නම් මාස තුනක් ඇතුළත ද අධි සංශෝධන/නිවැරැදි කිරීම් සහිත ව සමත් වූයේ නම් අවුරුද්දක් ඇතුළත ද යෝජිත සංශෝධන සහිත ව නිබන්ධය නැවත බාර දිය යුතු ය. අධි සංශෝධන සහිත අවස්ථාවල දී එම අයදුම්කරුවන් නැවත වාචික පරීක්ෂණයකට ද මුහුණ දිය යුතු ය.

පහත සඳහන් ක්ෂේත්‍රවලින් අදාළ පර්යේෂණ මාතෘකා තෝරාගත යුතුය:

I. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය
II. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය විචාරය
III. නූතන සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය
IV. නූතන සිංහල කාව්‍යය
V. නූතන සිංහල නාට්‍යය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කලා
VI. නූතන සිංහල සාහිත්‍ය විචාරය
VII. සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ අධ්‍යයනය
VIII. නූතන වාග්විද්‍යාව සහ සමකාලීන සිංහල භාෂාව
IX. සිංහල වාස්තුවිද්‍යාව සහ කලා ශිල්ප

X. සිංහල සමාජය සහ සංස්කෘතිය

**XI.** සිංහල ජනශ්‍රැතිය

XII. සිංහල භාෂාව සහ සාහිත්‍යය ඉගැන්වීම

## පාඨමාලා කාලසීමාව

| පාඨමාලාව | ශ්‍රී ලංකා ගුණාත්මක භාවය පිළිබඳ රාමුව **(SLQF) :** පියවර | නිල පාඨමාලා කාලය | උපරිම දීර්ඝ කිරීම | උපරිම නැවත ලියාපදිංචිය | ලියාපදිංචි දින සිට උපරිම කාලය |
|---|---|---|---|---|---|
| දර්ශනපති MPhil | 11 | වසර 2 | වසර 2 | වසර 1 * | වසර 5 |
| දර්ශනසූරි PhD | 12 | වසර 3 | වසර 3 | වසර 1 * | වසර 7 |

*නැවත ලියාපදිංචිය සඳහා අදාළ ගාස්තු ගෙවිය යුතු ය. ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුවට සාමාන්‍ය පාඨමාලා ගාස්තුවෙන් 50% ක් සහා වාර්ෂික ලියාපදිංචි ගාස්තුව ඇතුළත් වේ.

## පාඨමාලා ක්‍රියාවලිය

i. පාඨමාලා සඳහා අයදුම් කරන අවස්ථාවේ දී අයදුම්කරුවන් තම පර්යේෂණයට අදාළ වචන 750-1000ක් අතර පර්යේෂණ සාරාංශයක් ඉදිරිපත් කළ යුතුය.

ii. තිදෙනෙකුගෙන් සමන්විත විද්වත් මණ්ඩලයකින් එම පර්යේෂණ සාරාංශය සහ අයදුම්පත්‍රය පරීක්ෂාවට ලක් කෙරේ. තෝරා ගැනුණු අයදුම්කරුවන් වෙනුවෙන් පාඨමාලා ආරම්භයේ දී ම සුපරීක්ෂකවරයකු/වරුන් පත් කෙරෙන අතර ඔහු/ඇය/ඔවුන්ගේ උපදෙස් පරිදි පාඨමාලාව අවසානය දක්වා අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම අපේක්ෂා කෙරේ.

iii. අධ්‍යයනකටයුතුවල ප්‍රගතිය පිළිබඳ සියලු වාර්තා සුපරික්ෂකවරයාගේ අනුමැතිය සහිත ව ඉදිරිපත් කළ යුතුය.

iv. සෑම මාස හයකට වරක් ම එසේ සුපරික්ෂකවරයාගේ අත්සනින් යුතු ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තා පාඨමාලා සමබන්ධීකාරකවරයා මඟින් අංශප්‍රධාන වෙත යොමු කෙරේ.

v. බඳවා ගැනුණු සියලු ම අපේක්ෂයන් අනිවාර්ය සම්මන්ත්‍රණ පාඨමාලාවලට සහභාගී විය යුතු ය.

vi. පළමු සමාසිකය අවසානයේ පර්යේෂණ යෝජනාවලිය සකස් කොට එය පාඨමාලා සම්බන්ධිකාරකවරයා මඟින් අංශ ප්‍රධාන වෙත ඉදිරිපත් කළ යුතු ය.

vii. ඉන් අනතුරුව පරීක්ෂක මණ්ඩලයක් ඉදිරියේ පර්යේෂණ යෝජනාවලිය පිළිබඳ වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

viii. එම පරීක්ෂණය සමත් වීමෙන් පසු ව පර්යේෂණ කටයුතු ආරම්භ යුතු ය.

ix. ඔබගේ පර්යේෂණයට ආචාර ධර්මීය අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නම් උපදේශකවරයාගේ උපදෙස් මත අදාළ ආයතනයකින් එම අනුමැතිය ලබාගත යුතුය.

x. අදාළ කාලසීමාව අවසාන වීමට මාස තුනකට ප්‍රථම තම නිබන්ධය බාර දෙන බව අධ්‍යයනාංශයට ලිඛිත ව දැනුම් දිය යුතු අතර ඒ සමමග අවසන් වාචික පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතුය.

xi. නියමිත දිනට නිබන්ධයේ පිටපත් තුනක් විභාග අංශය වෙත බාරදිය යුතු ය.

xii. අදාළ දින පරීක්ෂක මණ්ඩලයක් ඉදිරියේ වාචික පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුය.

xiii. වාචික පරීක්ෂණය අවසානයේ සුළු සංශෝධන සහිතව සමත් වී ඇත්නම් මාස තුනක් ඇතුළත ද අධි සංශෝධන සහිතව සමත්වී ඇත්නම් අවුරුද්දක් ඇතුළත ද අවශ්‍ය සංශෝධන සිදු කොට නිබන්ධයේ අවසන් පිටපත බාර දිය යුතු ය. අධි සංශෝධන සහිත නිබන්ධ බාර දී ඇති අයදුම්කරුවන් අදාළ කාල සීමාව තුළ නිබන්ධය නැවත බාර දී නැවත වාචික පරීක්ෂණයකට ද (Viva-voce) මුහුණ දිය යුතු ය.

**සම්පූර්ණ කළ යුතු පාඨමාලා අවශ්‍යතා**

| **සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාව** | දර්ශනපති Phd | දර්ශනපති Mphil |
|---|---|---|
| සාරාංශ පර්යේෂණ යෝජනාව සහ අයදුම්පත | ✓ | ✓ |
| අනිවාර්ය පාඨමාලාවලට සහභාගීවීම | ✓ | ✓ |
| පර්යේෂණ යෝජනාවලිය | ✓ | ✓ |
| පර්යේෂණ යෝජනාවලිය පිළිබඳ වාචික පරීක්ෂණය | ✓ | ✓ |
| ආචාරධර්මීය අනුමැතිය ලබාගැනීම (වරණීය) | ✓ | ✓ |
| ස්වාධීන පර්යේෂණය | ✓ | ✓ |
| ප්‍රගති වාර්තා මාස 6කට වරක් | ✓ | ✓ |
| අවසන් වාචික පරීක්ෂණය (Viva Voce) | ✓ | ✓ |

**ශාස්ත්‍රීය අවංකභාවය**

ශාස්ත්‍රීය අවංකභාවය රැකගැනීම, පර්යේෂණ ආචාර ධර්මවලට අනුගතවීම, ලේඛන චෞරත්වයෙන් අත්මිදීමට අයදුම්කරුවෝ සපුරාම බැඳී සිටිති. එකී දෑ උල්ලංඝනය වන අවස්ථාවල විභාග වරද යටතේ අදාළ දඬුවම් නියම කිරීම සඳහා උසස් උපාධි මණ්ඩලය, පීඨ සභාව මඟින් සනාතන සභාවට අදාළ අවස්ථා වාර්තා කරනු ඇත.

## අනුමත පාඨමාලා ගාස්තු

| **අයකිරීම** | **දර්ශනපති**<br>MPhil SLQF<br>11 | **දර්ශනසූරි**<br>PhD SLQF<br>12 |
|---|---|---|
| | අවම වසර 2 / පර්යේෂණ සහ පාඨමාලා<br>[නිබන්ධය අර්ග (credits) 60] | අවම වසර 3 / පර්යේෂණ සහ පාඨමාලා<br>[නිබන්ධය අර්ග (credits) 90] |
| අයදුම්පත් ගාස්තුව | 2,000 | 2,000 |
| ලියාපදිංචි ගාස්තුව | 5,000 | 5,000 |
| පාඨමාලා ගාස්තුව | 250,000 | 400,000 |
| පුස්තකාල සේවා | 2,000 | 2,000 |
| නැවත ලබාගත හැකි පුස්තකාල තැන්පතුව | 3000 | 3000 |
| දර්ශනසූරි උපාධිය සඳහා වන දර්ශනපති උපාධි පාඨමාලාව (තුන් වන වර්ෂ ගාස්තුව පමණි) ** | | |
| තෙවන වසර පාඨමාලා ගාස්තුව | 200,000** | |

**පාඨමාලා ගාස්තුව:**

පාඨමාලා ගාස්තු වාරික දෙකක් යටතේ ගෙවිය හැකිය. අ) අයදුම්පත් ගාස්තුව, ලියාපදිංචි ගාස්තුව සහ පුස්තකාල සේවා ගාස්තුව ඇතුළු පළමු වාරිකය (පාඨමාලා ගාස්තුවෙන් 50%ක්)

පළමු වසර ආරම්භයේ දී ද දෙවන වාරිකය ( පාඨමාලා ගාස්තුවෙන් ඉතිරි 50%) දෙවන වසර ආරම්භයේ දී ද ගෙවිය හැකි ය.

** දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වී පසුව දර්ශනසූරි උපාධිය සඳහා උසස්වීම් ලද අයදුම්කරුවන් තෙවන වසර සඳහා මෙම ගාස්තුව ගෙවිය යුතු ය.